# ස්වච්ඡන්දතාවය පිළිබඳ හැඳින්වීමක්

ගෝනලගොඩ නන්ද හිමි

## හැඳින්වීම

දර්ශන විෂයෙහි දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්ව ඇති තේමාවක් වශයෙන් ස්වච්ඡන්දතාව (Free will) හඳුනාගත හැකිය. පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් පවතීද යන්න දාර්ශනික ගැටලුවක් සේ ගෙන දර්ශන විෂයෙහි සාකච්ඡා කරනු ලැබේ. ඊට අමතරව ආචාරධර්ම විෂයෙහි ද ප්‍රධාන තේමාවක් ලෙස ස්වච්ඡන්දතාවය පිළිබඳ සාකච්ඡා කෙරේ. මෙම කෙටි ලිපියෙන් අපේක්ෂා කෙරෙනුයේ ස්වච්ඡන්දතාවය පිළිබඳ සරල හැඳින්වීමක් සිදුකර ස්වච්ඡන්දතාවට විරුද්ධව ඉදිරිපත්ව ඇති කරුණු පිළිබඳ විග්‍රහයක් සිදු කිරීමයි. එහිදී ස්වච්ඡන්දතාවය කඩ කෙරෙන ප්‍රධාන ඉගැන්වීමක් වන නියතිවාදය (Determinism) සම්බන්ධයෙන් ද කරුණු දැක්වීමක් සිදු කෙරේ. බටහිර දර්ශනයෙහි මෙන්ම පෙරදිග දර්ශනයෙහි ද ස්වච්ඡන්දතාවය පිළිබඳ විග්‍රහයන් දැකිය හැකි බැවින් අවශ්‍ය අවස්ථාවල පෙරදිග බටහිර භේදයකින් තොරව කරුණු දක්වාලීම සිදු කරනු ලැබේ.

## සංදර්භය

ස්වච්ඡන්දතාව සම්බන්ධ විග්‍රහ ඇතැම් තැන්හි නිදහස හෝ ස්වාධීනත්වය යන අර්ථයෙන් සාකච්ඡා වී තිබේ (Campbell and others, 2004: 01). සාමාන්‍ය ව්‍යවහාරිත අර්ථයෙන් ගත්කළ ස්වච්ඡන්දතාවය යනු තම නිදහස් කැමත්තයි. එහෙත් මෙම වචනයෙහි නිරවුල් අර්ථය පුළුල් සංදර්භයක සිට සාකච්ඡා කළ යුතු වේ. එබැවින් ශබ්දකෝෂ අර්ථයන් හා නිර්වචන කිහිපයක් උපයුක්ත කරමින් ස්වච්ඡන්දතාවයෙහි මූලික ස්වභාවය හඳුනා ගැනීම මෙතැන් සිට සිදු කෙරේ. බ්‍රිටැනිකා විශ්වකෝෂයට අනුව විකල්පයන් අතුරෙන් එකක් තොරා ගැනීමට ඇති හැකියාව හෝ ස්වාභාවික, සාමාජීය හෝ දිව්‍යමය තහංචිවලින් තොරව ස්වාධීනව ක්‍රියා කිරීමට ඇති හැකියාව ස්වච්ඡන්දතාවයයි (britannica.com). විකල්පයන් අතුරෙන් යමක් තෝරා ගැනීමේ දී

ස්වච්ඡන්දතාවය පවතීනම් ස්වාධීනව තෝරා ගත හැකිය. එසේම නියත වූ සංකල්පයන් නොමැති තැන්හි ද ස්වච්ඡන්දතාවයක් ඇත. බ්‍රිටැනිකා විශ්වකෝෂයට අනුව ස්වච්ඡන්දතාවයට ප්‍රතිපක්ෂ කාරණයක් වශයෙන් (restraints) තහංචි හෙවත් බැඳීම් පවතී. ඒ අනුව පුද්ගලයා විවිධ බැඳීම්වලින් තොරව ස්වාධීනව ක්‍රියාත්මක වන්නේ නම් එය ස්වච්ඡන්දතාවයකි. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව ස්වච්ඡන්දතාවය යනු දෙවියන් වහන්සේගේ හෝ දෛවයෙහි පාලනයකින් තොරව තමාට තීරණයක් ගැනීමට ඇති ශක්තියයි (Oxford Advanced Learner's Dictionary of Current English, 620). ඒ අනුව වෙනත් බාහිර පාලනයකින් තොරව තමාටම තීරණයක් ගැනීමට ඇති හැකියාව ස්වච්ඡන්දතාවය වශයෙන් හඳුනාගත හැකිය. මීට අමතරව ස්වේච්ඡාවෙන් තීරණය ගැනීම ස්වච්ඡන්දතාවය වන බව ද දක්වා තිබේ (merriam-webster.com). පූර්වයෙන් දැක් වූ අර්ථකථනයන්ට සමගාමීව අර්ථ දැක්වෙන සිංහල ශබ්දකෝෂයන්හි ද ස්වච්ඡන්දතාවය විස්තර කර ඇත්තේ සිය කැමත්තට ගැළපෙන බව සිය කැමත්තට අනුව ක්‍රියා කිරීම යනාදියයි (සිංහල අක්ෂර වින්‍යාස ශබ්දකෝෂය, 2020: 329). ශබ්දකෝෂ විවරණයන්ට අනුව ස්වච්ඡන්දතාවය යන්නෙන් අදහස් කරනුයේ බාහිර බලපෑමකින් තොරව ස්ව කැමත්ත පරිදි ක්‍රියා කිරීමට ඇති හැකියාවයි.

ස්වච්ඡන්දතාවය පිළිබඳව විවිධ නිර්වචන ඉදිරිපත්ව තිබේ. රොබට් කාන්ට අනුව ස්වච්ඡන්දතාවය පුද්ගල පැවැත්මෙහි ඇති බලයකි (Robert kane, 1985: 2). ඒ අනුව පුද්ගල පැවැත්ම විෂයෙහි උපයෝගී වන්නක් ලෙස මෙය හඳුනාගත හැකිය. මෙහි පුද්ගල පැවැත්ම යනුවෙන් අදහස් කර ඇත්තේ ස්වාධීන පැවැත්ම විය යුතුය. වෙනත් බාහිර බලවේගයන්හි බලපෑම තිබුණ ද පුද්ගල පැවැත්ම අහෝසි නොවේ. එහෙත් එම පුද්ගල පැවැත්මෙහි හා වෙනත් සත්ත්වයන්ගේ පැවැත්ම අතර වෙනසක් නොමැත. වෙනස පවතිනුයේ උසස් චින්තනය තුළයි. එබැවින් තීරණ ගැනීමේ ශක්තිය පුද්ගලයා සතු බලයක් යැයි පෙන්වා දී ඇත. ගුණපාල ධර්මසිරිට අනුව බාහිර බලපෑමක් නොමැතිව තමාගේ කැමැත්තෙන් කරන ක්‍රියාව ස්වච්ඡන්දතාවයෙන් යුතු ක්‍රියාවක් වේ (ධර්මසිරි, 2007: 135.) ධර්මසිරි මතයට අනුව බාහිර බලපෑමකින් තොරව ස්ව කැමැත්තට අනුව ක්‍රියා කිරීමට හැකිවීම ස්වච්ඡන්දතාවයයි. මෙම අදහසට

තරමක් පක්‍ෂ එහෙත් ඊට ඉදිරියෙන් සිටින නිර්වචනයක් කුලසේන විදානගමගේ ඉදිරිපත් කොට ඇත. අභ්‍යන්තර හෝ බාහිර බලවේගවලින් තොරව නිදහස් තීරණ ගැනීම සම්බන්ධව කෙනෙකුට ඇති හැකියාව සවච්ඡන්දතාව වන බව විදානගමගේ දක්වයි. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් කරුණු දක්වන විදානගමගේ සඳහන් කරනුයේ ස්වච්ඡන්දතාව යන්න නියම වශයෙන් අර්ථවත් වනුයේ අදාළ තීරණයන් ගැනීමට පමණක් නොව ඒවා ක්‍රියාත්මක කිරීමේ දි ඇති හැකියාව පදනම් කරගෙන බවයි (විදානගමගේ, 2007: 222). ඒ අනුව තීරණයන් ගැනීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව ද ස්වච්ඡන්දතාවය සතු වේ.

මේ ආකාරයෙන් හඳුනාගත හැකි ස්වච්ඡන්දතාවයෙහි මූලික ලක්‍ෂණය වනුයේ බාහිර හෝ අභ්‍යන්තර බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කිරීමට ඇති නිදහසයි. පුද්ගලයාට ස්ව කැමත්තට අනුව තීරණ ගත හැකි වුවද ඒවා ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථා තිබේ. එවැනි විට ස්වච්ඡන්දතාවයෙහි වලංගු බවක් තිබේද යන්න ගැටලු ඇති කරන්නකි. ස්වච්ඡන්දතාවය සමග වගකීම යන වචනය සම්බන්ධ ව පවතී. ඊට හේතු වනුයේ ඕනෑම පුද්ගල ක්‍රියාවක වගකීම පැවරෙනුයේ පුද්ගල ස්වච්ඡන්දතාවය මත වීමයි. යම් ක්‍රියාවක් බාහිර හෝ අභ්‍යන්තර බලපෑමකින් යුක්තව සිදුවන්නේ නම් එහි නියම කාරකයා පුද්ගලයා නොව වෙනත් හේතූන්ය. ඒ හේතුවෙන් ස්වච්ඡන්දතාවය සමග වගකීම බද්ධව පවතින බව දැක්විය හැකිය. සදාචාර දර්ශනයෙහි සාකච්ඡා වන හොඳ නරක විනිශ්චයෙහිලා ප්‍රධාන මිණුම වශයෙන් ද ස්වච්ඡන්දතාවය සැලකිය හැකිය. හොඳ නරක යනුවෙන් ආචාරධර්ම මිණුමක් පවතිනුයේ පුද්ගලයාට යමක් කිරීමට පෙර ඒ පිළිබඳ විමසීමටය. හොඳ ක්‍රියාවක් කළහොත් කුමක් වේද නරක ක්‍රියාවක් කළහොත් කුමක් වේද යනුවෙන් විමසා ස්වාධීන චින්තනයක් ඇති කිරීමට ස්වච්ඡන්දතාවය උපයුක්ත වේ. ස්වච්ඡන්දතාවයක් නොමැති විට හොඳ නරක සංකල්ප අර්ථ ශූන්‍ය වන අතර ආචාරධර්ම පද්ධතිය ද බිඳ වැටෙන බව පෙන්වා දී ඇත (ධර්මසිරි, 2007: 135). ජේ. බී. වොට්සන්ට අනුව සිය කැමත්ත සඳහා චේතනාව අවශ්‍ය අතර චේතනාව සඳහා සිය කැමැත්ත අවශ්‍ය වේ (විදානගමගේ, 2007: 223). ඒ අනුව චේතනාව හා කැමැත්ත අතර අන්‍යොන්‍ය සබඳතාවයක් පවතී. යමක් කිරීමට කැමත්ත මෙන්ම

චේතනාවක් තිබිය යුතුය. එබැවින් ඕනෑම ක්‍රියාවක් චේතනාත්මකව කැමත්ත මත සිදුවන අතර එමගින් ස්වච්ඡන්දතාවය පවතින බව ගම්‍ය කරයි.

යම් ක්‍රියාවක් පුද්ගල ස්වච්ඡන්දතාවයෙන් වියුක්තව සිදු වීනම් එහි වගකිම කර්මකාරක පුද්ගලයාට හිමි නොවේ. ස්වච්ඡන්දතාවයෙන් යුක්තව සිදුවුණි ද ඇතැම් අවස්ථාවල වරද කර්මකාරකයාට හිමි නොවේ. නිදසුන් වශයෙන් ශ්‍රී ලංකාවේ දණ්ඩනීති සංග්‍රහයේ එන 69 සිට 99 දක්වා ව්‍යතිරේකයන් පෙන්වා දිය හැකිය. 75වන වගන්තියට අනුව වයස අවුරුදු අටකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. 76 වගන්තියට අනුව යම් අවස්ථාවකදී තමාගේ හැසිරීමේ ස්වභාවය හා එහි ප්‍රතිඵලය නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොලත්, වයස අවුරුදු අටකට වැඩි අවුරුදු දොළහකට අඩු ළමයකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. 77 වගන්තියට අනුව ක්‍රියාව කරන වේලෙහි එම ක්‍රියාවෙහි ස්වභාවය හෝ තමා වැරදි දෙයක් හෝ නීතියට පටහැනි ක්‍රියාවක් කරන බව, සිහි විකලත්වය නිසා දැන ගැනීමට පුළුවන් කමක් නැති තැනත්තකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ. මේ ආදී අවස්ථාවලදී පුද්ගල කැමැත්තට අනුව ක්‍රියා කළද ඒවා වරදක් වශයෙන් සැලකීම සිදු නොවේ. අවශ්‍යතාවය මත ස්වච්ඡන්දතාවයෙන් යුක්තව යම් ක්‍රියාවන් සිදු කළ ද ඇතැම් අවස්ථාවල වරදක් වන්නේ නැත. නිදසුනක් වශයෙන් මහමග ගමන් කරන කුඩා ළමුන් පිරිසක් අනතුරකින් බේරා ගැනීමට වෙනත් තනි පුද්ගලයකු ගමන් කරන වාහනයක් උපද්‍රවයකට ලක් කිරීම පෙන්වා දිය හැකිය. වැඩි උපයෝගිතාව මත කරුණු සාධනය කිරීමක් එයින් කළ හැකිය. ඒ අනුව ස්වච්ඡන්දතාවය පුද්ගලයා තුළ පැවතිය ද එහි ස්වභාවය නිශ්චය කර ගැනීම අසීරු බව මෙමගින් පැහැදිලි වේ.

පෙරදිග දර්ශනයට අනුව බ්‍රාහ්මණ යුගයේ දී පුද්ගල ස්වච්ඡන්දතාවය සම්පූර්ණයෙන්ම බිඳ වැටී තිබුණ බව හඳුනාගත හැකිය. මහා බ්‍රහ්මයා විසින් ලෝකය මවන ලදැයි යන විශ්වාසය ස්වච්ඡන්දතාවය බිඳ දමන්නකි. ඉදිරියේ දී ඒ පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. එහෙත් පෙරදිග දර්ශනයෙහි එන බෞද්ධ ඉගැන්වීම නියතිවාදී අදහස් ප්‍රතික්ෂේප කරයි. වීමසංක හා කාලාම වැනි

සූත්‍රයන් ඊට නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකිය. බටහිර දර්ශනයට අනුව ස්වච්ඡන්දතාවය මූලික සංකල්පයක් ලෙස ඉදිරිපත් කරනුයේ ඇරිස්ටෝටල් විසිනි. ඇරිස්ටෝටල් ඉච්චානුගත ක්‍රියා හා අනිච්චානුගත ක්‍රියා වශයෙන් කොටස් දෙකක් දක්වා තිබේ. ඉච්චානුගත ක්‍රියා යනුවෙන් හැඳින්වෙනුයේ දැන දැන කරන ක්‍රියාවන්ය. අනිච්චානුගත ක්‍රියා වනුයේ නොදැන කරන ක්‍රියාවන්ය. ඒ අනුව පළමු ගණයෙහිලා ගැනෙන ක්‍රියා ස්වච්ඡන්දතාවයෙන් යුක්ත වන අතර දෙවැනි ගණයේ ක්‍රියා ස්වච්ඡන්දතාවයෙන් තොර ක්‍රියා වේ (අරියනන්ද හිමි, 2010, 153). ඇරිස්ටෝටල්ගෙන් පසුව ග්‍රීක යුගයෙහි විවිධ චින්තකයන් මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ ද මධ්‍යතන යුගයෙහි උදාවත් සමග ස්වච්ඡන්දතාවය මුළුමනින්ම යටපත් වූ බව පෙන්වා දිය හැකිය. ක්‍රිස්තියානි පල්ලි සංස්ථාව මගින් ගෙනගිය ගතානුගතික හා අධානග්‍රාහී ව්‍යාපෘතිවලින් මතු වූ දේවවාදය මගින් ස්වච්ඡන්දතාවය මුළුමනින් අහෝසි කරන්නට විය. එහෙත් සමකාලීන දර්ශනයෙහි උදාවත් සමග පුද්ගලයාට ස්වච්ඡන්දතාවයක් පැවතිය යුතුය යන ස්ථාවරය මතු වූ බව පෙනේ. නමුත් සමස්ත බටහිර දර්ශන ඉතිහාසය පුරාවට ස්වච්ඡන්දතාවයට විරුද්ධ තර්ක ඉදිරිපත් වී තිබේ. එබැවින් ස්වච්ඡන්දතාවයට විරුද්ධව ඉදිරිපත්ව ඇති මතවාද කිහිපයක් පිළිබඳව මෙතැන් සිට සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

ස්වච්ඡන්දතාවයට ප්‍රතිපක්ෂ මතය වනුයේ නියතිවාදයයි. සියල්ල නියත වී ඇති බැවින් පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් නොමැති බව මෙමගින් අවධාරණය කරයි. ජෝන් හොස්පර්ස්ට අනුව කිසිඳු ආකාරයකට මිනිසා නිදහස් නැත. ඔහුගේ නිදහස තීරණය වන්නේ ද නියතයකට අනුවය (සිල්වා, 2004: 61-62). මේ ආකාරයට පුද්ගලයාට ස්වච්ඡන්දතාවයක් නොමැති බව දක්වමින් විවිධ කරුණු ඉදිරිපත් වී තිබේ. ඒ අතුරින් කරුණු කිහිපයක් ප්‍රධාන වශයෙන් ගෙන සාකච්ඡා කළ හැකිය.

- ඊශ්වර නියතිවාදය
- කර්ම නියතිවාදය
- ආරය පිළිබඳ නියතිවාදය

- පරිසරය පිළිබඳ නියතිවාදය
- හේතුඵල නියතිවාදය

ඉස්සරනිම්මාණවාදය වශයෙන් හැඳින්වෙන ඊශ්වර නියතිවාදයෙන් දක්වා ඇත්තේ ලෝකය දෙවි කෙනෙකුගේ නිර්මාණයක් බවයි. සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් ලෝකය මවා ඇති බැවින් පුද්ගලයාට ස්වච්ඡන්දතාවයක් නොමැති බව මෙම මතය ඉදිරිපත් කරන්නන්ගේ අදහසයි. පෙරදිග බ්‍රාහ්මණ ඉගැන්වීම්වල හා ක්‍රිස්තියානි ආදී දේවවාදී ආගම්වල මෙවැනි අදහස් ඉදිරිපත් වේ. ඒ අනුව මිනිසා ඇතුළු සමස්ත ලෝකය මවා ඇත්තේ දෙවියන් වහන්සේ විසිනි. එබැවින් සියල්ල තීරණය කරනු ලබන තීරකයා වනුයේ දෙවියන් වහන්සේය. සියල්ල දෙවියන් වහන්සේ මවා ඇති බැවින් අනාගතයෙහි සිදුවන සිදුවීම් ද සිදුවනුයේ දේව නියතියකට අනුවය. මේ හේතුව නිසාවෙන් පුද්ගලයාට ස්වච්ඡන්දතාවයක් නොමැති බව දක්වයි. නමුත් ඇතැම් ක්‍රිස්තයානි දේවධර්මාචාර්යවරු දක්වා ඇත්තේ දෙවියන් වහන්සේ සර්වඥ වුවද මිනිසාට යම් ස්වච්ඡන්දතාවක් ලබා දී ඇති බවයි (ධර්මසිරි, 2007: 136). එහෙත් මෙම මතය ද ප්‍රතික්ෂේප කොට තිබේ. කර්ම නියතිවාදී අදහස් දරන්නන්ගේ මතය වනුයේ සියල්ල කර්මය මත සිදුවේය යන්නය. පෙරදිග දර්ශනයෙහි සාකච්ඡා වන පුබ්බේකත හේතුවාදය මගින් ද ගම්‍ය කරනුයේ මෙම අදහසයි. පුද්ගලයා යම් යම් ක්‍රියාවන් සිදුකළ ද ඒ සියල්ල සිදුවනුයේ කර්මය හේතුවෙනි. පුද්ගලයාට ස්වාධීන වූ චින්තනයක් නොමැත. සියල්ල තීරණය කරනු ලබන කේන්ද්‍රීය ලක්ෂ්‍ය වනුයේ කර්මයයි. කර්ම නියතිවාදී අදහස් ඉන්දියාවේ හා ලංකාවේ ජීවත් වන මිනිසුන් විසින් පිළිගනු ලබන අධිභෞතික සංකල්පයක් බව දක්වා තිබේ (අරියනන්ද හිමි, 2010: 157). බුදුදහමට අනුව කර්මය නියාම ධර්මයකි. නියාම ධර්ම පහක් සඳහන් වන අතර ඉන් එක් නියාම ධර්මයක් වශයෙන් කර්මය සැලකිය හැකිය. ඒ අනුව කර්මය බලපෑම් කළ ද සම්පූර්ණ වශයෙන් බලපෑමක් නොකරන බව බුදුදහමෙහි දක්වා තිබේ. කර්මය නියතියක් වශයෙන් ගෙන කරුණු දක්වන පිරිස් සඳහන් කරනුයේ සියල්ල කර්මය විසින් තීරණය කරන්නේ නම් පුද්ගලයාට ස්වච්ඡන්දතාවයක් පැවතිය නොහැකි බවයි.

ස්වච්ඡන්දතාවක් නොමැති බවට නූතනයෙහි ඉදිරිපත්ව ඇති මතයක් වශයෙන් ආරය පිළිබඳ නියතිවාදය හැඳින්විය හැකිය. පරම්පරාගත මව්පිය ජාන මගින් පුද්ගලයා හා ඔහුගේ ස්වාධීනත්වය පාලනය කරන බව ආරය පිළිබඳ කරුණු දක්වන අයගේ පිළිගැනීමයි. දියවැඩියා රෝගය මව්පිය ජාන මගින් පැමිණෙන රෝගයක් වශයෙන් හඳුනාගෙන තිබේ. ඊට අමතරව වෙනත් ශ්වසන (හතිය) වැනි ආබාධ ද මව්පිය ජාන මගින් පරම්පරාගතව පැමිණේ. මේ පිළිබඳ බ්‍රිතාන්‍ය ජාතික සර් ප්‍රැන්සිස් ගැල්ටන් බ්‍රිතාන්‍යයෙහි වැදගත් යැයි පිළිගත් පරම්පරාවක් ආශ්‍රය කරමින් පර්යේෂණයක් සිදු කරණ ලදී. එම පරම්පරාවෙහි සියලු දෙනා සැලකිය යුතු බුද්ධිමතුන් සහ දක්ෂයින් වූ බව සොයාගත හැකි විය. එම පර්යේෂණයෙහි අවසන් නිගමනය වනුයේ බුද්ධිමත්භාවය සහ දක්ෂභාවය ප්‍රවේණිගතව වර්ධනය වී ඇති බව දක්වාලීමයි.

ඇමරිකාවේ ඩැග්ඩේල් නම් පර්යේෂකයා නරක යැයි සම්මත පරම්පරාවක් ආශ්‍රය කරමින් එවැනි පර්යේෂණයක් සිදුකළ අතර ඔහුගේ නිගමනය වූයේ නරකභාවය ප්‍රවේණ්‍යානුගතව පැමිණි බවයි (ධර්මසිරි, 2007: 138). ආරය පුද්ගල ස්වච්ඡන්දතාවට පූර්වයෙන් පැමිණෙන බැවින් පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් නොමැති බවට කරුණු දැක්වීමක් සිදුකර තිබේ. ස්වච්ඡන්දතාවට විරුද්ධව මතුවන වෙනත් තර්කයක් වනුයේ පරිසර පිළිබඳ නියතිතාවයයි. පුද්ගල පෞරුෂය සකස්වීමෙහිලා ජීවත් වන පරිසරය බලපෑම් කරන බැවින් එය නියතියක් වන බවත් පුද්ගල ස්වච්ඡන්දතාවයට ප්‍රමුඛත්වයක් නොලැබෙන බවත් දක්වා ඇත. පුද්ගලයා යහපත් පරිසරයක ජීවත් වුවහොත් ඔහුගේ පෞරුෂය සකස්වීමට එම පරිසරය බලපානු ලැබේ. අයහපත් පරිසරයක ජීවත් වුවහොත් අයහපත් බව පෞරුෂය සකස්වීමෙහිලා බලපානු ලබයි. පරිසරය යන්න සංස්කෘතියෙන් සංස්කෘතිය හෝ ප්‍රදේශයෙන් ප්‍රදේශය හෝ වෙනත් සාධක මත වෙනස් වේ. බෞද්ධ සංස්කෘතිය තුළ සත්ව ඝාතනය නොකළ යුත්තක් වුවද වෙනත් යුරෝපා වැනි රටවල සත්ව ඝාතනය සිදු කිරීම ගැටලුවක් නොවේ. ඊට හේතුව වනුයේ පරිසරයෙහි ස්වභාවයයි. මේ අනුව කරුණු දක්වන පිරිස් දක්වනුයේ පුද්ගල පෞරුෂය සකස්වීමට පරිසරය බලපාන බැවින් ස්වච්ඡන්දතාවක් නොමැති බවයි. හේතුඵල නියමය ඇසුරු කරමින් ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප කරන පිරිස් දක්වා

ඇත්තේ සියල්ලට හේතුවක් ඇති බවයි. සියල්ලට හේතුවක් ඇති බැවින් එය අනන්ත හේතු සන්තතියක් දක්වා ගමන් කරනු ලැබේ. ඒ අනුව සියලු හේතුන්ට ඵලයක් තිබිය යුතුය. එම ඵලයෙහි හිමිකරුවා හේතුව මිස ස්වච්ඡන්දතාවය නොවන බව පෙන්වා දී තිබේ. බුදුදහමෙහි ද හේතුඵල සම්බන්ධයක් ගැන කියැ වේ. එහෙත් බෞද්ධ හේතුඵල සම්බන්ධය මෙම අදහසින් වෙනස් වන බව ගුණපාල ධර්මසිරි දක්වා ඇත. බෞද්ධ හේතුඵල ඉගැන්වීම නියතියක් නොවේ. හේතුඵල නියමයෙහි ස්වභාවය අවබෝධ කරගත් කල්හි එම තත්‍වයෙන් ඔබ්බට ගමන් කළ හැකි වීම එහි විශේෂත්‍වයයි.

මේ ආකාරයෙන් හඳුනාගත හැකි නියතිවාදී අදහස්වලින් ස්වච්ඡන්දතාවයක් නොමැති බව තහවුරු කිරීමට උත්සහ කර තිබේ. එහෙත් ස්වච්ඡන්දතාවක් ඇති බවට කරුණු දක්වන පිරිස් නියතිවාදය ප්‍රතික්ෂේප කිරීමට අදාළ තර්ක ඉදිරිපත් කර තිබෙන බව හඳුනාගත හැකිය. හයිසන්බර්ග් අනීර්ණයනතා මූල ධර්මය උපයෝගී කරගනිමින් නියතිවාදය ප්‍රතික්ෂේප කර ඇත (උපනන්ද හිමි, 2010: 26). හයිසන්බර්ග් දක්වනුයේ ලෝකය හැමවිටම වෙනස්වන බවයි. එබැවින් ලෝකයෙහි නියතිවාදයක් දැකිය නොහැකි බව සඳහන් කරයි. එඩ්ගා කේසි වැනි නූතන චින්තකයන් කර්ම නියතිවාදය ප්‍රතික්ෂේප කර තිබේ. ඒ අනුව ස්වච්ඡන්දතාවයට පක්ෂව මෙන්ම විපක්ෂව විවිධ මතවාද ඉදිරිපත් වී තිබෙන බව හඳුනාගත හැකිය. මෙහිලා කල්පනා කර බැලිය යුතු වනුයේ මිනිසාට පූර්ණ ස්වච්ඡන්දතාවක් පවතීද නැද්ද? යන්නයි. මෙතෙක් සාකච්ඡා කරණ ලද කරුණුවලින් විශද වන කාරණයක් වනුයේ ස්වච්ඡන්දතාවයට විපක්ෂව ඉදිරිපත් කරණ ලද ඇතැම් තර්ක එකහෙලා ප්‍රතික්ෂේප කළ නොහැකි බවයි. ආරය හා පරිසරය පිළිබඳ නියතිවාදය ගතහොත් පුද්ගල කැමැත්ත විෂයෙහි ඒවා යම් ආකාරයෙන් බලපාන බව හඳුනාගත හැකිය. එහෙත් පූර්ණ වශයෙන් ඒවා මත පදනම්ව ස්වච්ඡන්දතාවක් නැතැයි යන නිගමනයෙහි එල්බ ගැනීම සිදුකළ නොහැකිය.

සොක්‍රටීස් මරණය වැළඳ ගැනීම පිළිබඳ සිදුවීම ස්වච්ඡන්දතාවයෙහි ඉහළ අවස්ථාවක් වශයෙන් සැලකිය හැකි වේ. සොක්‍රටීස් සිරගත වූ කල්හි ඔහුට අවශ්‍ය නම් සිරෙන් පැනයාමට තරම් අවකාශ තිබිණි. එහෙත් සොක්‍රටීස් සිර මැදිරියෙන් පැන යාම

වෙනුවට වස පානය කිරීම කළ යුතු බව සිතීය. එබැවින් සොක්‍රටීස් වස පානය කොට ජීවිතයෙන් සමුගත්හ. සොක්‍රටීස් සමාජ සම්මතයට හා පොදු නීතියට ගරු කිරීමක් වශයෙන් ස්වයං මරණය සිදු කරණ ලද්දේ සිර මැදිරියෙන් පැනයාමේ අවකාශය වළකාලමිනි. මෙම කරුණින් ගම්‍ය වනුයේ සියලු නියතතාවයන්ගෙන් වියුක්තව කොක්‍රටීස් සිය කැමත්තට අනුව තීරණයක් ගෙන ඇති බවයි. එහෙත් ස්වයං මරණය තොරා ගැනීම කොතරම් දුරට යුක්ති සහගත ද යන්න විමසිය යුත්තකි. ඇල්බෙයා කැමූ එක් අවස්ථාවක දක්වනුයේ සියදිවි නසා ගැනීම සදාචාර ගැටලුවක් නොවන බවයි. කැමූ දක්වනුයේ මිනිසා මායාවකට පැටලී ඇති බැවින් යථාර්ථවත් විය යුතු බවයි. එහෙත් අපේක්ෂාවන් භංගවන හෙයින් සියදිවි නසා ගැනීම සාධාරණ බව දක්වා තිබේ. නමුත් එය මිනිස් පැවැත්ම යථාර්ථවත් කිරීමට හේතු නොවන බැවින් විසඳුම් කිහිපයක් යෝජනා කරන කැමූ දක්වනුයේ 'ඉතා අසීරුවෙන් එනම් කෙසේ හෝ ජීවන ගැටලුවලට මුහුණ දීම' කළ යුතු බවයි (එදිරිසිංහ 2001: 220.) සියදිවි නසා ගැනීම හා සුබ මරණය තෝරා ගැනීම පිළිබඳ සවච්ඡන්දතාවය කොතරම් දුරට වාස්තවික වන්නේ ද යන්න දාර්ශනිකව සාකච්ඡා කළ යුතු කරුණක් බැවින් මෙහිලා ඒ පිළිබඳ සාකච්ඡා කරනු නො ලැබේ. එහෙත් තෝරා ගැනීම් කිහිපයකින් එකක් තොරා ගැනීමේ හැකියාව පවතින බව එයින් ගම්‍ය වේ. මීට අමතරව සංදෘෂ්ටිකවාදී දාර්ශනිකයෙකු වන සාත්‍රේගේ දර්ශනයෙහි ද ස්වච්ඡන්දතාවාදී අදහස් පිළිබිඹු වේ. වරක් එක් පුද්ගලයෙකු සාත්‍රේ වෙත පැමිණ ප්‍රශ්නයක් විමසයි. තමා ආදරණීය මව ළඟ නතර වන්න ද යුද්ධ කිරීම පිණිස යුධ සේවයට යන්න ද යනුවෙන් විමසයි. එහිදී සාත්‍රේගේ පිළිතුර වනුයේ තමාට කැමති දෙයක් කරන්න යන්නය. පුද්ගල නිදහස හෙවත් ස්වඡන්දතාවය පිළිබඳ සාත්‍රේ රචනා කළ විවිධ ග්‍රන්ථයන්හි තොරතුරු දක්නට ලැබේ. එම ග්‍රන්ථ අතර පැවත්ම හා ශූන්‍යත්වය (Being and Nothingness) නමින් රචිත ග්‍රන්ථය සුවිශේෂී වේ. සාත්‍රේ බෙදීම්වලින් යුක්ත නියතිතාවයන්ට විරුද්ධ වනුයේ මෙම ග්‍රන්ථයේදීය (බණ්ඩාර, 2017: 103). නිදහස පුද්ගලයාට අවශ්‍ය සාධකයක් සේ පෙන්වා දුන් මොහු එමඟින් මිනිස් ක්‍රියාකාරීත්වය හා සවිඥානිකත්වය ඇති වන බව පෙන්වා දුන්නේය. සාත්‍රේ පෙන්වා දෙන්නේ මිනිසාට සුවිශේෂී චින්තන හැකියාවක් පවතින බැවින් ස්වඡන්දතාවයෙන් යුතුව ක්‍රියා කළ යුතු බවයි. පුද්ගලයා වෙනත්

වස්තු වෙනුවෙන් පැවතීම හෙයින් මෙකී ස්වඡන්දතාවය යටපත් වී ඇති බව සාත්‍රේ පෙන්වා දී ඇත.

**සමාලෝචනය**

ස්වච්ඡන්දතාවය සම්බන්ධයෙන් විමසීමේදී පක්‍ෂව මෙන්ම විපක්‍ෂව විවිධ මතවාද හා තර්ක ඉදිරිපත්ව තිබෙන බව හඳුනාගත හැකිය. සච්ච්ඡන්දතාවක් ඇති බවට කරුණු දක්වන පිරිස් නියතිවාදයෙන් තොර ස්වාධීන වූ ස්වච්ඡන්දතාවක් පවතින බව පෙන්වා දී ඇත. හයිසන්බර්ග් වැනි චින්තකයන් ඉදිරිපත් කර ඇත්තේ ලෝකය වෙනස් වන බැවින් නියතතාවයන් පැවතිය නොහැකි බවයි. 'එකම ගඟකට දෙවරක් බැසිය නොහැක' වැනි දාර්ශනික කියමන්වලින් ද විශද වනුයේ වෙනස් වීමේ ස්වභාවයයි. එහෙත් මෙයට විරුද්ධව කරුණු දක්වන නියතවාදීන්ගේ අදහස වනුයේ පුද්ගලයාට ස්වාධීන වූ ස්වච්ඡන්දතාවක් පැවතිය නොහැකි බවයි. ඊට හේතුව වනුයේ පුද්ගලයා බාහිර හා අභ්‍යන්තර බලපෑම් මගින් මෙහෙයවීමය. මෙම කරුණු අනුව පැහැදිලි වනුයේ ස්වච්ඡන්දතාවය පිළිබඳ ගැටලුව සංකීර්ණ හා නොවිසඳුන ගැටලුවක් බවයි. ආරය හා පරිසරය වැනි සාදක පුද්ගල පෞරුෂය විෂයෙහි බලපාන බව සොයාගෙන තිබේ. සැබෑ ලොව අනුව බැලුව ද ආරය හා පරිසරය වැනි සාධක පුද්ගල පෞරුෂය සඳහා ඇතැම් අවස්ථාවන්හි බලපා තිබෙන බව සොයාගත හැකිය. එහෙත් එය ඍජුවම සියලු පෞරුෂය විෂයෙහි බලපාන බව කිව නොහැකිය. ඒ අනුව පැහැදැලි වනුයේ ස්වච්ඡන්දතාව විෂයෙහි යම් යම් බාහිර හා අභ්‍යන්තර සාධක ඇතැම් අවස්ථාවන්හි බලපාන බවයි. එහිදී යුතුකම් හා වගකීම් ප්‍රධාන වේ. නමුත් ඉන් ස්වච්ඡන්දතාවක් නොමැති බව ප්‍රකට නොවේ. එබැවින් මෙයින් මතුවන ගැටලුව වනුයේ පුද්ගලයාට පූර්ණ ස්වච්ඡන්දතාවක් තිබේද යන්නයි. පුද්ගලයාට පූර්ණ ස්වච්ඡන්දතාවක් පැවතිය ද ක්‍රියාත්මක කිරීමේදී බාහිර හා අභ්‍යන්තර කරුණු බලපාන බැවින් ස්වාධීන පැවැත්ම පිළිබඳ ගැටලුවක් මතුවන බව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. අරියනන්ද හිමි, රත්මල්කැටියේ. 'ස්වච්ඡන්දතාව පිළිබඳ දාර්ශනික විමර්ශනයක්' (2010) *බෞද්ධ ආචාර විද්‍යාව:* විටියල ඉන්දසිරි මාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය (සංස්.) පනාමුරේ චන්දිම් හිමි සහ තවත් අය. ස්ථානය සඳහන් නොවේ: පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.
2. උපනන්ද හිමි, රත්තොට. (2010) *දාර්ශනික ප්‍රවේශය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
3. එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස. (2001) *දාර්ශනික විමර්ශන.* දෙහිවල: වත්මා ප්‍රකාශකයෝ.
4. ධර්මසිරි, ගුණපාල. (2007) *දාර්ශනික ප්‍රශ්න.* බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
5. බණ්ඩාර, වත්සුල. (2017) *මහද්වීපික දාර්ශනික ප්‍රවේශය.* ස්ථානය සඳහන් නොවේ: කතෘ ප්‍රකාශන.
6. විදානගමගේ, කුලසේන. (1997) *දාර්ශනික ගැටලු.* නාරම්මල: කතෘ ප්‍රකාශන.
7. *සිංහල අක්ෂර වින්‍යාස ශබ්දකෝෂය,* (2020) කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
8. සිල්වා, පී. ජී. ඥානසිරි. (2004) *ආචාරවාදය හැඳින්වීමක්.* වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.
9. Campbell, Joseph keim and others 'freedom and Determinism A framework' (2004) freedom and Determinism (ed.) Joseph keim Campbell and others, London: A Bradford book.
10. Hornby, A.S. (2010) *Oxford Advanced Learner's Dictionary of Current English 8*. U.K: Oxford University press.
11. Kane, Robert. (1985) *Free will and Values*. New York: State University of New York.
12. Simon. Blackburn. (2016) *Oxford DICTONARY OF Philosophy*. U.K: Oxford University press.
13. https://www.britannica.com Accessed on 23rd sep 2021.
14. https://www.merriam-webster.com Accessed on 23rd sep 2021.